**සී/ස ලංකා නැව් සංස්ථාව - 2022/ 2023**

**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සී/ස ලංකා නැව් සංස්ථාවේ ("සමාගම") 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතු භාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 හි 57 (a) i (LKAS 19) ඡේදයට අනුව ආයතනය විසින් එහි පාරිතෝෂික පිළිබඳ ගිණුම්කරණ ප්‍රමිතයට අදාළව කටයුතු කරන විට එය ප්‍රක්ෂේපනය කරන ලද ඒකක ණය ක්‍රමයට අනුව (Actuarial Technique, the projected unit credit method) ගණනය කර ගිණුම්ගත කළ යුතු වුවද සමාගම විසින් රු.29,348,420 ක පාරිතෝෂික ගණනය කිරිම හා ගිණුම්ගත කිරීම අදාළ ගිණුම්කරණ ප්‍රමිතයට අනුව සිදු කර නොතිබුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 අනුව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සකසන ලද EXCEL ආකෘතියට දත්ත ඇතුලත් කිරීම මගින් අප විසින් පාරිතෝෂික ගණනය කරන ලදී. එම ගණනය කිරීම නිවැරදි දත්ත ඇතුලත් කිරීම් මගින් ස්වයංක්‍රීයව ගණනය සිදුවන අතර ඊට අදාළ සියලු ලේඛන විද්‍යුත් තැපෑල මගින් (email) ඔබ වෙත ලබා දී ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 අනුව පාරිතෝෂික ගණනය කිරීමට හා ගිණුම්ගත කිරීමට කළමනාකරණය පියවර ගත යුතු බව. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 (LKAS 37) හි ප්‍රතිපාදන වෙන්කිරිමේ අවිනිශ්චිත වගකිම් පිළිබඳ 14 වන ඡේදයට අනුව ආයතනයට වර්තමාන වගකිමක් ඇති අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සම්පත් පිටතට ගලායාමේ වගකිම ඇති විටක සහ එම ප්‍රමාණය පිළිබඳව විශ්වාසනිය ඇස්තමේන්තුවක් කළ හැකි විටක ඒ වෙනුවෙන් අවසන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන වෙන් | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයට අනුව මෙම නඩු කටයුතු වෙනුවෙන් සම්පත් පිටතට ගලායාමේ හැකියාව පිළිබඳ සහ එම ප්‍රමාණයන් පිළිබඳ විශ්වාසනිය ඇස්තමේන්තුවක් කළ නොහැකි බැවින්, ප්‍රතිපාදන වෙන් කිරිමක් කර නොමැති බවත්, ඒ බව මූල්‍ය අංශයට වාර්තා නොවීම මත හෙළිදරව් කිරිමට අතපසු වී ඇති බව පිළිගන්නා අතර ඉදිරි මූල්‍ය ප්‍රකාශ වලදී එම මගහැරීම නිවැරදි කරන බව සඳහන් කරමි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 අනුව කටයුතු කර අදාළ හෙළිදරව් කිරීම් කිරීමට කළමනාකරණය පියවර ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | කිරිම හා හෙළිදරව් කිරිම් කළ යුතු වුවද, සමාගමට එරෙහිව එහි සේවයේ නියුතුව සිටි සේවකයින් 10 දෙනෙකු පවරා තිබුණු නඩුවලට අදාළව 2022/2023 වර්ෂයේ අවසන් මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරිමක් සිදු කර නොතිබුණි. | | |
| (ඇ) | 2021/2022 වර්ෂයට අදාළ කුලියට ගත් නැව් මගින් ගල් අඟුරු ප්‍රවාහනය සඳහා දරන ලද වියදම (Charter Hire Expenses Coal Vessel) වන රු.5,572,187 ක් 2022/2023 ගිණුම් වර්ෂයේදී හඳුනාගෙන ඇති බව විගණනයේ දී අනාවරණය වූ අතර ඒ හේතුවෙන් 2021/2022 වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා ඇති අතර LKAS 08 ගිණුම්කරණ ප්‍රමිතය 42 (ආ) අනුව හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශයේ ආරම්භක රඳවාගත් ඉපයීම්වලට අතීතයට බලපාන ලෙස පෙර වර්ෂයේ ගැලපීම් ලෙස ගැලපිය යුතු වුවත් එය 2022/2023 වර්ෂයේ සෘජු වියදම් යටතට ගලපා ඇති අතර ඒ හේතුවෙන් 2022/2023 වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි. | ඔබගේ පැහැදිලි කිරීමට අනුව 2021/2022 වර්ෂයට අදාල ඉහත වියදම වන රු.5,571,187.00 වන මුදල එම වර්ෂයේ වියදමක් ලෙස සටහන් විය යුතු අතර සමාගමේ නැව් කුලියට දීමේ අංශය විසින් ඒ බව දැනුම් දෙන ලද්දේ 2022/23 වර්ෂයේ ලංකා ගල් අඟුරු සමාගමෙන් අපගේ ඉන්වොයිස්වලට මුදල් පියවන අවස්ථාවේදීය. නමුත් 2021/22 වර්ෂයේ විගණනය අවසන් කර තිබූ හෙයින් අදාල වර්ෂයට (2021/22) ගිණුම් ගත කිරීමට නොහැකි විම හේතුවෙන් 2022/23 වර්ෂයට වැරදීමකින් ගලපන ලදී. ඒ අනුව ඉහත වියදම වන රු. 5,572,187.00 ක මුදල 2021/22 වර්ෂයේ ලාභ/අලාභ ගිණුමේ ඉදිරියට ඇති ශේෂයට ගැලපිය යුතු බවට එකග වේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 අනුව පෙර වර්ෂ ගැලපීම් කළ යුතු ගනුදෙනු නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු බව. |

**1.5.3 සමාගමේ අඛණ්ඩ පැවැත්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 මාර්තු 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අලාභය රු.1,857,129,766 ක් වූ අතර සමුච්චිත පාඩුව රු.10,855,139,608 ක් විය. තවද, 2023 මාර්තු 31 දිනට සමාගමේ ශුද්ධ වත්කම් වල අගය රු.9,210,094,328 ක සෘණ අගයක් විය. වර්ෂය සඳහා වූ අලාභය පෙර වර්ෂයට සාපේක්ෂිතව සියයට 67.79 කින් අඩු වී ඇති අතර සමාගමේ ශුද්ධ වත්කම්වල සෘණ ශේෂය පෙර වර්ෂයට සාපේක්ෂිතව සියයට 16.37 කින් ඉහළ ගොස් ඇත. සමාගම නෞකා දෙකක් මිලදී ගැනිම සඳහා 2014 වර්ෂයේදී ඇ.ඩො.මිලියන 70 ක කාලින ණයක් (Term Loan) සහ එම | 2022/2023 වර්ෂය සඳහා වාර්තාගත මූල්‍ය අලාභයක් දැරීමට සිදු වූයේ, මහජන බැංකුව වෙතින් එක්සත් ජනපද ඩොලර් වලින් ණය මුදලක් ලබා ගත් දිනයේ සිට ප්‍රවර්තන වර්ෂය දක්වා වන කාල සමය තුළ විනිමය අනුපාතයේ සිදු වූ අසාමාන්‍ය වෙනස්වීම හේතුවෙනි.<br><br>අදාළ ණය මුදල ලබාගත් අවස්ථාව වන විට පැවති විනිමය අනුපාතය රුපියල් 135 ක් වූ අතර මේ වන විට එම අගය, රුපියල් 336.01 දක්වා ඉහළ ගොස් තිබුණි. | සමාගමේ අඛණ්ඩ පැවැත්ම ආරක්ෂාකර ගැනීම සඳහා විශේෂ මහා සභා රැස්වීම්වල ගනු ලැබූ මූල්‍යමය අලාභය අවම කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණය කටයුතු කළ යුතු බව. |

ණය පොලිය ගෙවීමට පොලී ප්‍රාග්ධනිත ණයක් ලෙස ඇ.ඩො.මිලියන 5.44 ක් මහජන බැංකුවෙන් ලබා ගෙන තිබූ අතර, 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ගෙවා තිබූ කාලින ණය, පොලී ප්‍රාග්ධනිත ණය සහ ඊට අදාළ පොලිය රු.2,828,293,385 ක් සමාගම විසින් මහජන බැංකුවට ගෙවීමට සිදුවීම මත 2023 මාර්තු 31 දිනට එක්සත් ජනපද ඩොලර් ණය ශේෂය ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනය කිරීමේදී රු.2,811,891,329 ක් වූ විනිමය අලාභයක් සිදුව තිබීම සමාගමේ සමස්ථ අලාභයට හේතු වී තිබුණි. ඒ අනුව සමාගමේ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධව පවතින අවිනිශ්චිතතාව පිළිබඳව පැහැදිලි ඇඟවීමක් ඇති බව නිරීක්ෂණය විය. මෙම තත්ත්වය මග හරවා ගැනිම සඳහා 2021 ජූලි 30 වැනි දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ දී (EGM) සමාගම ක්‍රියාමාර්ග යෝජනා කර තිබුණද, එම විනිමය අලාභය අවම කිරිමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරිමට සමාගම අපොහොසත් වී තිබුණු අතර 2023 මාර්තු 24 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේදී ඒ සඳහා නව ව්‍යාපාරික ව්‍යාපෘති 06 ක් තවදුරටත් යෝජනා කර තිබුණි.

2022/2023 කාල පරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව 12.38% කින් අවප්‍රමාණය විය. නමුත් එම අගය, මහජන බැංකුවේ යාත්‍රා ණය ලබා ගත් 2015/2016 කාල සමය හා සසඳන කළ, ශ්‍රී ලංකා රුපියල 2022/2023 වර්ෂයේ දී එක්සත් ජනපද ඩොලරයට එරෙහිව 148.89% ක් වූ ප්‍රමාණයකින් අවප්‍රමාණයවී තිබුණි. මෙම තත්ත්වය, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සංස්ථාවේ වාර්ෂික ගිණුම්වල අනිවාර්ය ප්‍රතිපාදනයක් ලෙස සැලකෙන රුපියල් මිලියන 2,811.89 ක් වශයෙන් ගණනය වන අදාළ යාත්‍රා ණය හා සම්බන්ධ විනිමය අලාභය ඉහළ මට්ටමක් කරා ගෙන යාම කෙරෙහි සෘජුවම බලපෑම් ඇති කළේ ය. අදාළ විනිමය අලාභයේ බලපෑමට අමතරව, සංස්ථාවේ ශුද්ධ වත්කම් අගය රු.9,210,094,328/- ක සෘණ අගයක් පිළිබිඹු වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපෑ අනෙකුත් හේතු සාධක 18ක් සඳහන් කර තිබුණි.
.

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

#### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව 2023 මාර්තු 31 දින වන විට සී/ස ලංකා නැව් සංස්ථාවට අයවිය යුතු වෙළඳ ණයගැති වටිනාකම රු.2,070,761,878 කි. එයින් රු.1,034,044,153 ක ප්‍රමාණයක් වසර 4 කට වඩා වැඩි කාලයක් අය කර ගැනීමට නොහැකි ශේෂ වන අතර රු.257,530,960 ක් වසර 1 සිට 4 දක්වා අයකර ගැනිමට නොහැකි ශේෂ වන අතර 2022/2023 වර්ෂය තුළ ඇති වූ වෙළඳ ණයගැති වටිනාකම | විගණක ප්‍රකාශය හා එකඟ වෙමි. | ණයගැතියන්ගෙන් මුදල් එකතු කර ගැනීම සඳහා විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් අනුගමනය කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | රු.779,186,765 ක් විය. ඉහත වෙළඳ ණයගැතියන් අතර දේශිය රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන වලින් සමාගමට අයවිය යුතු මුදල් රු.1,525,359,729 ක් වන අතර එයින් ද රු.618,045,453 ක් වසර 03කට වඩා වැඩි පැරණි ණයගැතියන් වන බවත්, වසර 03 කට වඩා පැරණි විදේශීය හා අනෙකුත් වෙළඳ ණයගැතියන්ගෙන් 2023 මාර්තු 31 දිනට අයවිය යුතු ශේෂය රු.163,752,420 ක් බවත් අනාවරණය විය. | | |
| **(ආ)** | සී/ස ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම සහ සී/ස ලංකා නැව් සංස්ථාව අතර 2021 සැප්තැම්බර් 21 දින ඇතිකර ගත් ගල් අඟුරු ප්‍රවාහන ගිවිසුමේ 19 ඡේදයට අනුව සමාගම වෙත ගෙවිය යුතු ප්‍රමාදය / රඳවා තබා ගැනීම පිළිබඳ සියලුම හිමිකම්, පැටවීම හෝ මුදාහැරීම අවසන් වූ පසු, දින තිහක් (30) ඇතුළත ගෙවිය යුතු වුවද සමාගමට රු. 3,728,788 වටිනාකම් සහිත ඉන්වොයිසි 2ක මුදල් 2023 අගෝස්තු 14දින වන විටත් අයකර ගැනිමට නොහැකිව තිබුණි. | මෙම ප්‍රමාද ගාස්තු ඇතුළු රුපියල් බිලියනයකට වැඩි මුදල් ප්‍රමාණයක් ලංකා ගල් අඟුරු සමාගම විසින් ගෙවිය යුතුව ඇත. ඒ සඳහා ගත යුතු සෑම උත්සහයක්ම සංස්ථාව විසින් ගෙන ඇත. එහි එක් ප්‍රථිපලයක් ලෙස ණය අයකර ගැනීම සඳහා කමිටුවක් පත්කරනු ලැබූ අතර එම කමිටුව විසින්ද මෙම මුදල් ලංකා නැව් සංස්ථාවට ගෙවිය යුතු බව නිර්දේශ කර ඇත. නමුත් තවමත් එම මුදල් ප්‍රමාණය අයකර ගැනීමට නොහැකි වී ඇත. | ණයගැතියන්ගෙන් මුදල් එකතු කර ගැනීම සඳහා විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් අනුගමනය කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතු බව. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක. 01/2020හි 11.1ඡේදය | 2023 මාර්තු 31දිනට අදාළ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත යොමු කිරිම ඉදිරි මුදල් වර්ෂයේ ජුනි 30වන දිනට පෙර සිදුකළ යුතු වුවත්, සමාගම විසින් අබලි භාණ්ඩ 133ක් ඉවත් කිරීමට හා ඊට අදාළ අනෙකුත් කාර්යයන් විගණන දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. | සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ සඳහන් කර ඇති පරිදි, අබලි ද්‍රව්‍ය එක්රැස් කොට ඇස්තමේන්තුගත කිරීම සඳහා කටයුතු කරගෙන යමින් පවතියි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ උපදෙස් පරිදි භාණ්ඩ සමීක්ෂණය අදාල කාලය තුල සිදු කර විගණකාධිපති වෙත යොමු කිරිමට කටයුතු කල යුතු බව |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2018 අංක 19 ජාතික විගණන පනතේ 16.2 වගන්තිය සහ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ඇතුළත සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද, සමාගමේ මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කර තිබුණේ මාස දෙකකට වැඩි ප්‍රමාදයකින් යුතුව 2023 අගෝස්තු 16 දින දීය. | අදාළ ප්‍රකාශය හා එකග වෙමි. අප විසින් මූල්‍ය ප්‍රකාශ 2023 අගෝස්තු 16 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලදී. | ජාතික විගණන පනත හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ උපදෙස් පරිදි ගිණුම් වර්ෂය අවසන් වී අදාළ කාලය තුළ සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතු බව |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක. 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොත 3.2 වගන්තිය | විධිමත් අනුමැතියකින් තොරව සමාගම විසින් සමාලෝචිත වර්ෂයේදී සංග්‍රහ දීමනාව, ප්‍රවාහන දීමනාව සහ පැමිණීමේ දිරි දීමනා වෙනුවෙන් එකතුව රු.15,209,673 ක් ගෙවා තිබුණි. | මෙහි සඳහන් දැනට ගෙවන්නා වූ සංග්‍රහ දීමනාව, ප්‍රවාහන දීමනාව සහ පැමිණීමේ දිරි දීමනා ආයතනයේ සේවක මණ්ඩල කාර්යය පටිපාටියේ අංක 05 යටතේ 2018.02.27 දින පැවැති 231 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 36/2018 සඳහා ලබා දුන් තීරණය අනුව 2018 අප්‍රේල් මස 01 දින සිට අනුමැතිය සහිතව මේ දක්වා ගෙවීම් කටයුතු කරගෙන යන ලදී. | සී/ස ලංකා නැව් සංස්ථාව සම්පූර්ණයෙන් රජය සතු සමාගමක් නිසා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවලට අනුගතව කටයුතු කළ යුතු බැවින් අදාළ දීමනා සඳහා විධිමත් අනුමැතියක් ලබාගත යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.433,605,111 ක පාඩුවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු.4,567,786,074ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,134,180,963 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ඍජු වියදම් රු.2,452,659,820 ක් හෙවත් සියයට 43ක් සහ මූල්‍ය වියදම් රු.2,427,000,405 ක් හෙවත් සියයට 36 කින් අඩුවීම සහ අනෙකුත් ආදායම් රු.364,031,003 ක් හෙවත් සියයට 77කින් වැඩිවීම හේතු වී තිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| Mv Ceylon Breeze නෞකාව අනතුරට පත්වීම සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය. | | |
| i. Mv Ceylon Breeze නෞකාව 2020 වර්ෂයේදී චීනයේ ජියැංගින් වරායේදී ධීවර යාත්‍රාවක (Fishing Vessel) ගැටීම හේතුවෙන් සමාගමට සිදු වූ සම්පූර්ණ | චීන උසාවිය සමග නීතිමය ක්‍රියාමාර්ගය ඉදිරියට රැගෙන ගියහොත් ධීවර යාත්‍රාවට වූ හානිය ගෙවීමට නියමිත අලාභය පමණක් | නාවික අනතුරුවලදී සමාගමේ නෞකාවලට සිදුවන හානිවලදී අලාභයන් සඳහා වන්දි ලබා ගැනීමට තවදුරටත් විධිමත් හා |

| | | | |
|---|---|---|---|
| | අලාභය ආසන්න වශයෙන් රු.16,999,188 ක් වී තිබුණි. මෙම නෞකාව රක්ෂණ ආවරණයට අදාළ ගිවිසුම අනුව දැක්වෙන අඩුකිරීම් (Deductible) අගය USD 100,000ක් වීම හේතුවෙන් ඉහත අලාභය එම අගයට අඩුවීම නිසා සමාගම විසින් දරාගත යුතුවිය. තවද, එම නෞකාව නැවත වරක් 2021 ජුනි මස 06 දින සිංගප්පූරුවේ දී ලියෝපෝල්ඩ් නෞකාව සමග ගැටීම හේතුවෙන් සිදු වූ අනතුරට අදාළ අලාභය මෙම වාර්තාවේ දිනය වන විටත් ගණනය කර නොතිබුණි. | නොව අපගේ නඩු ගාස්තු ද වීන නැවේ නඩු ගාස්තු හා අපගේ **Mv. Ceylon Breeze** නෞකාව ට වූ හානිය ද අප විසින් දරාගත යුතුව ඇත.<br>ඒ අනුව එකී උපදෙස සලකා බැලීමෙන් අනතුරුව නැව් සංස්ථා කළමණාකාරීත්වය හා අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ඇතිව නැව් සංස්ථාව ට තවදුරටත් පාඩු සිදුවීම වැලැක්වීම සඳහා **RMB 135,000/- (USD 20,149/-)** නීත්‍යානුකූල ගිවිසුමක් මාර්ගයෙන් ආරවුල සමතයකට පත්කරන ලදී. තවද එවකට ඇතුලත් වී ඇති රක්ෂණ ඔප්පුවලට අනුව එහි මූලික කොන්දේසියක් වන්නේ **US$ 100,000/- deductible** අගයට වඩා අප නෞකාවේ අලාභය අඩුවී ඇති බැවින් අප සංස්ථාවට නෞකාවේ අලාභය දරා ගැනීමට සිදුවී ඇත. | කඩිනම් ක්‍රමවේද භාවිත කළ යුතු බව. |
| **ii.** | නෞකා හානිවීම පිළිබඳව පරික්ෂණයක් සිදු කර ඊට අදාළ වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීමට කටයුතු කර නොමැති බවත් 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන මුදල් චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව හානි සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට වාර්තා කළයුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණු බවත් අනාවරණය විය. | නැව් සංස්ථාවේ වාර්ෂික ගිණුම් ප්‍රකාශය 2020/2021 වාර්ෂික වාර්තාවට ඇතුලත් කර ඇත.<br>තවද 261 අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම හා 262 අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම්වලට අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා යොමු කරමින් සිද්ධිය සම්බන්ධව ලිඛිතව දැනම් දීම සිදුකර ඇත.<br>එමෙන්ම සෑම අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමකදීම මහා භාණ්ඩාගාරය නියෝජනය කරමින් මහා භාණ්ඩාගාරයේ නියෝජිත වරයෙකු සහභාගී වන අතර සියලුම අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවන් සටහන් හා තීරණ ලිඛිතව දැනුම් දෙනු ලැබේ. | අදාළ චක්‍රලේඛයේ සඳහන් උපදෙස් පරිදි නෞකා හානිය සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තර මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු බව. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 ජනවාරි 21 දිනැති අංක. අමප 16/0035/737/003 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව සහ 2005 මැයි 06 දිනැති අංක. 415 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධානවලට අනුව, සියලුම රාජ්‍ය ආයතන භාණ්ඩ ආනයනය කළ යුත්තේ සී/ස ලංකා නැව් සංස්ථාව හරහා වන අතර එහිදී සමාගම, රාජ්‍ය ආයතනවලට ප්‍රමුඛත්වය ලබා දිය | 2019/20, 2020/21, 2021/22 සහ 2022/23 මූල්‍ය වර්ෂ වලදී රාජ්‍ය අංශයේ භාණ්ඩ ප්‍රවාහනය කිරීම්, නැව් සංස්ථාව හරහා සිදු කිරීමේ සිද්ධි සංඛ්‍යාව හා එකඟ වේ. පෙර වර්ෂයන්වලදී සේම 2018/19 මූල්‍ය වර්ෂයන්හිදීද දැනටමත් නැව් සංස්ථාව ප්‍රවාහනයන් සිදු කරන, අර්ධ වශයෙන් සිදු කරන හා නොකරන ආයතනයන් හා | රාජ්‍ය ආයතන නැව් මඟින් භාණ්ඩ ආනයනය කිරීමේදී නැව් සංස්ථාව හරහා ප්‍රවාහනය කරවා ගැනීමට අදාළ ක්‍රියාමාර්ග කළමනාකරණය |

යුතුවේ. 2019 අප්‍රේල් 01සිට 2023 මාර්තු 31 දක්වා වර්ෂ 4 තුළ රාජ්‍ය අංශයේ භාණ්ඩ ආනයනය කිරීමේ ආයතන ගණන සහ අවස්ථා ගණන පරීක්ෂා කිරීමේදී, සී/ස ලංකා නැව් සංස්ථාව හරහා භාණ්ඩ ආනයනය කිරීමේ ආයතන ගණන සහ අවස්ථා ගණන සාපේක්ෂව අඩුවෙමින් පවතින බව නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

| වර්ෂය | 2019/20 | 2020/21 | 2021/22 | 2022/23 |
|---|---|---|---|---|
| ආයතන ගණන | 28 | 22 | 23 | 27 |
| ආනයන වාර ගණන | 2,357 | 1,925 | 1,300 | 821 |

නිරන්තර දැනුවත් කිරීම් හා සාකච්ඡා සංවිධානය කරනු ලැබූ බැවින් ඉහල කාර්යය සාධන මට්ටමක් ලඟා කර ගැනීමට සංස්ථාව සමත් විය. එහෙත් රට තුල පමණක්ම නොව සමස්ථයක් ලෙස ගත් විට මුළු ලොව තුලම ඇතිවූ අයහපත් තත්වයන් හි ඍජු හා වක්‍ර බලපෑම හේතුවෙන් 2020/21, 2021/22 හා 2022/23 මූල්‍ය වර්ෂයන්හිදී සංස්ථාව හරහා ප්‍රවාහනය කරන ලද සිද්ධි සංඛ්‍යාව සංඛ්‍යාත්මකව අඩු විය. ඒ සඳහා බලපෑ ප්‍රධාන හේතූන් 10ක් විය.

විසින් ගත යුතු බව.

**(ආ)** අංක 415 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධානවලට අනුව සී/ස ලංකා නැව් සංස්ථාව විසින් අත්හැරීමේ නිවේදනයක් නිකුත් කළයුතු වන්නේ රජයට වඩාත් වාසිදායක ලෙස ආනයන භාණ්ඩ ප්‍රවාහනය කිරීමට සමාගම අපොහොසත් වන අවස්ථාවකදී පමණි .සමාගමට දැරීමට සිදුවන නැව් කුලිය, සැපයුම්කරු එකඟවන ලද නැව් කුලියට වඩා වැඩිවන අවස්ථාවලදී ඒ බව අත්හැරීමේ නිවේදනයක් මගින් ආනයනකරුට දැන්විය යුතු වුවත්, නැව්ගත කිරීමෙන් අනතුරුව අත්හැරීම් නිවේදන ඉල්ලා සිටීම, හදිසි මිලදී ගැනීම හේතුවෙන්, CIF මිල ගණන් මත ප්‍රසම්පාදනය පිරිනමා තිබීම හා වෙනත් හේතු මත සමාගම විසින් 2019/20 වර්ෂය තුළ 319ක් ද, 2020/21 වර්ෂයේදී 298 ක් ද, 2021/22 වර්ෂයේදී 185 ක් ද, 2022/23 වර්ෂයේදී 118ක් ද, වශයෙන් චක්‍රලේඛයේ නියමයන්ට බැහැරව අත්හැරීම් නිවේදන නිකුත් කර තිබුණි.

සංස්ථාව විසින් නිකුත් කරනු ලබන මුළු අත්හැරීමේ නිවේදන සංඛ්‍යාවෙන් ඉතා වැඩි ප්‍රමාණයක් මෙම කාණ්ඩය යටතේ නිකුත් කරනු ලබන අතර ඒ හා සම්බන්ධ ප්‍රධානම ආයතනයන් ලෙස සෞඛ්‍ය අංශයට සම්බන්ධ ආයතනයන් හඳුනාගෙන තිබේ. එම ආයතනයන් හි ඇති ව්‍යුහය මෙන්ම ආනයනය කරනු ලබන භාණ්ඩ ප්‍රමාණයේ විශාලත්වය හේතුවෙන් අනුගමනය කරනු ලබන විවිධ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග මෙයට බලපා තිබේ.

භාණ්ඩ ආනයන කටයුතු වලදී සැපයුම්කරුගේ අභිමතය පරිදි ප්‍රවාහනය සිදුකර ඇති විටෙක, එම භාණ්ඩයන් සඳහා අවශ්‍ය ලිපි ලේඛන, ණයවර ලිපි නිකුත් කර ඇති බැංකුවෙන් නියමිත පරිදි ලබා ගනිමින් ප්‍රමාද ගාස්තු දැරීමෙන් තොරව නිෂ්කාශන කටයුතු කිරීම සඳහා අත්හැරීමේ නිවේදන නිකුත් කිරීමට සිදුව තිබේ.

කෙසේ වෙතත්, නැව් ගත කිරීමට ප්‍රථමව සාමාන්‍ය පරිදි ප්‍රවාහනය සඳහා අදාළ ආයතන විසින් අපවෙත විමසීම් ලබා දෙන්නේ නම්, ඒවාට අදාළ ප්‍රවාහන කටයුතු නැව් සංස්ථාව මගින් ඉටු කිරීමේ හැකියාවක් තිබිය හැකි අතර විදේශ විනිමය ගලායෑම් ප්‍රමාණය අවම කර, විදේශ විනිමය ප්‍රමාණයක් රට තුල ඉතිරි කිරීමේ හැකියාවක්ද තිබිණි. එය කල හැකි වන්නේ අදාළ ප්‍රසම්පාදනයන් සිදුකරන ආයතන, ලංසු ලේඛන පිලියෙල කිරීම වැනි ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී මේ පිලිබඳ සැලකිල්ලක් දැක්වුවහොත් පමණි.

රාජ්‍ය ආයතන නැව් මඟින් භාණ්ඩ ආනයනය කිරීමේදී නැව් සංස්ථාව හරහා ප්‍රවාහනය කරවා ගැනීමට අදාළ ක්‍රියාමාර්ග කළමනාකරණය විසින් ගත යුතු බව.

| | | | |
|---|---|---|---|
| (ඇ) | පූර්ණ රාජ්‍ය හිමිකාරිත්වය ඇති සමාගමක් ලෙස රාජ්‍ය අංශයේ ආනයන භාණ්ඩ ප්‍රවාහනය තුළින් සමාගමේ ලාභදායිත්වය වර්ධනය කරගැනීම මෙන්ම, විදේශීය නැව් සමාගම් මගින් සිදු කෙරෙන රාජ්‍ය ආනයන තරඟකාරී නැව් ගාස්තු ක්‍රමයක් මත සමාගම වෙත නතුකර ගැනීමේ වගකීම සමාගම වෙත පැවරී තිබුණද සමාගමේ ප්‍රවාහන ගාස්තුව, ආනයනයට සම්බන්ධ සැපයුම්කරුවන්ගේ නැව් ගාස්තුවලට වඩා වැඩිවීම හේතුවෙන් 2020/2019 සිට 2022/23 වර්ෂය දක්වා වර්ෂ 4 තුළ පිළිවෙලින් මෙම අත්හැරීමේ නිවේදන 174ක්, 163ක් , 150ක් සහ 67ක් නිකුත් කර තිබුණි. | බොහෝ සැපයුම්කරුවන් ඔවුන්ගේ ලංසු ලේඛන වල යථාර්තවාදී නොවන භාණ්ඩ ප්‍රවාහන ගාස්තු (unrealistic freight rates) සඳහන් කරනු ලැබුවත් සත්‍ය වශයෙන්ම නාවුක ක්ෂේත්‍රයේ එවැනි ප්‍රවාහන මිල ගණන් නොපවතී. CIF මිල සඳහන් කිරීමේදී නිවැරදි හා භාණ්ඩ ප්‍රවාහන ගාස්තු සඳහන් කිරීම වෙනුවට සැපයුම්කරු විසින් භාණ්ඩ ප්‍රවාහන ගාස්තු වලින් කොටසක් FOB මිලට හෝ භාණ්ඩයේ පිරිවැයට එකතු කර තිබීම මීට ප්‍රධාන හේතුව විය හැකිය.<br><br>විවිධ ආනයනයන්හි අනුගමනය කරනු ලබන ප්‍රසම්පාදන කටයුතු වලින් පසුව ඉදිරිපත් කර තිබෙන මිල ගණන් සඳහා දිගුකාලීන වලංගුභාවයක් ඉල්ලා සිටින තත්වයන්ද බොහෝවිට දැකිය හැකි අතර දැඩි උච්චාවචනයන් සහිත වූ නාවුක වෙළඳපොළෙහි පහල මට්ටමේ මිල ගණන් දිගුකාලීන වලංගුතාවයක් ලබා දීමට නොහැකිවීමේ ප්‍රායෝගික ගැටළුවද පවතී. ඉහත සඳහන් චක්‍රලේඛයේ සැබෑ තීව්‍රතාවයට මෙවැනි අක්‍රමිකතා බෙහෙවින් බලපා තිබේ. | නාවුක ක්ෂේත්‍රයේ පවතින දැඩි තරඟකාරී තත්ත්වය යටතේ භාණ්ඩ ප්‍රවාහනය සමාගම වෙත නතුකර ගැනීමේ විධිමත් මිල තීරණය කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු බව. |
| (ඇ) | විදේශ කටයුතු අමාත්‍යාංශයට අදාළ රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්ගේ ආනයන සහ අපනයන ගමන් මළු බඩු බාහිරාදිය හැසිරවීම, ඇසුරුම් කිරීම, ප්‍රවාහනය හා නිෂ්කාෂණය සී/ස ලංකා නැව් සංස්ථාව විසින් සිදු කරනු ලබන අතර සේවාව සපයන ආයතනය වන සී/ස ලංකා නැව් සංස්ථාව විසින් අදාළ මිල ගණන් පිළිබඳ තීරණය ගත යුතු වුවද, එය විදේශ කටයුතු අමාත්‍යාංශයේ අධ්‍යක්ෂක ජනරාල්ගේ FA/OAM&D/HD/CSC/GEN හා 2023 ජනවාරි 25 දින දරන ලිපිය අනුව මිල ගණන් තීරණය කරනු ලබන බව හෙළිදරව් විය. | විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලාංකික තානාපති, මහකොමසාරිස් හා කොන්සෝල් කාර්යාලවල සේවය සඳහා පත්වීම් ලබන රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්ගේ බඩු බාහිරාදිය දොරින් - දොරට (Door to Door basis) නමැති සේවා කාණ්ඩය යටතේ සී/ස ලංකා නැව් සංස්ථාව මගින් සපුරාලනු ලබන අතර රාජ්‍ය තාන්ත්‍රික සේවා කාලය අවසන්ව පැමිණෙන නිලධාරින් සඳහා මෙරට වරායේ සිට නිවෙස් වෙත (Discharging Port to Door) වූ සේවාවද ලබා දෙනු ලබයි. සංස්ථාව විසින් සපයනු ලබන සේවාවන් සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් අනුමත වූ මිල මට්ටම් අනුව ගෙවීම් කටයුතු කරනු ලබන අතර සපයනු ලබන සේවා සඳහා වූ බලපාන විවිධ සාධක වල වෙනස්වීම්වලට අනුකූල සංස්ථාව විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හමුවේ විටින් විට මිල සංශෝධනයන්ද කරනු ලබයි. | පිළිතුරේ දක්වා ඇති පරිදි විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වී අදාළ ගාස්තු සංශෝධනය කර ගැනීමට කළමණාකාරීත්වය කටයුතු කළ යුතු බව. |

අනපේක්ෂිත අයුරින් ආර්ථිකයේ සිදුවූ වෙනස්කම්වලට සරිලන ආකාරයෙන් අපගේ සේවාවන් සඳහා වූ ගාස්තුන් ඉහල නංවන ලෙස 2022.05.31, 2022.07.05 හා 2022.10.20 වැනි දිනයන්හි ලිඛිතවද, ඊට අමතරව දෙපාර්ශවය අතර පැවති සාකච්ඡා මගින්ද ඉල්ලීම් කලද, ආසන්න වශයෙන් 25%ක පමණ ප්‍රමාණයකින් ගාස්තු ඉහල නැංවීමට අනුමැතිය ලබා දී ඇත.

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 නොවැම්බර් 10 සී/ස ලංකා නැව් සංස්ථාව සහ TERO MARINE ASIA PACIFIC PTE LTD සමඟ වසර 6 ක කාල සීමාවක් සඳහා සමාගමේ නෞකාවන් වෙනුවෙන් පරිගණක පාදක නැව් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට USD 102,800 කට ගිවිසුම් ගත වී තිබුණි. පළමු වර්ෂය තුළ අදියර 03 කින් මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ අතර එහි අත්තිකාරම් මුදල් වෙනුවෙන් රු.2,903,208 ක් (USD 15,400) සහ පද්ධති සැලසුම් පිළිගැනීම වෙනුවෙන් රු.1,563,087 ක් (USD 7,700) ක් ලෙස රු.4,466,295 ක් වැයකර නෞකා 02 සඳහා පද්ධතිය ස්ථාපිත කර වසර 3 ක කාලයක් ගත වී තිබුණද, මෙම පරිගණක පද්ධතිය ක්‍රියාත්මක නොකර පැවති අතර සමාගමේ ඉදිරි මෙහෙයුම් කටයුතු සඳහා යොදා ගන්නේද නැද්ද පිළිබඳව කළමනාකරණය විසින් සමාලෝචනයක් සිදු කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් අදාල වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. | පෙන්වා දී ඇති නිරීක්ෂණ සමඟ එකඟ වන අතර 2020 දී පැවති Covid 19 වසංගත තත්ත්වය හේතුවෙන් යම් ප්‍රමාදයක් සිදුව ඇත. නෞකා සම්බන්ධ කලමනාකරණ කටයුතුවලදී මෙම පරිගණක පද්ධතිය වැදගත් වන බව කළමනාකරණය විසින් සමාලෝචනය කර ඇත. මෙම ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කිරීමට තාක්ෂණික අධිකාරී වෙත උපදෙස් ලබාදී ඇත. | සමාගමේ ඉදිරි මෙහෙයුම් කටයුතු සඳහා මෙම පරිගණක පද්ධතිය යොදා ගන්නේද නැද්ද යන්න පිළිබඳව කළමනාකරණය විසින් සමාලෝචනයක් සිදුකර විධිමත් තීරණයක් ගත යුතු බව. |
| (ආ) | පුත්තලම ලක්විජය බලාගාරයට ගල් අඟුරු ප්‍රවාහනය කරන නැව්වලට විවිධ සේවා සැපයීම සඳහා ලංසු කැඳවා තෝරාගත් බෝට්ටු සේවා 02ක් වෙනුවෙන් තාක්ෂණික ඇගයීම් | පුත්තලම ලක් විජය ගල් අඟුරු බලාගාරයට ගල් අඟුරු ප්‍රවාහනය කරන නැව්වලට බෝට්ටු ලබාගැනීමට විධිමත් පරිදි ජාතික පුවත්පත් වල ප්‍රසිද්ධ කර පාරදෘශ්‍ය භාවයකින් යුතුව | පුවත්පත් දැන්වීම්වලට අමතරව අදාළ ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීමට කටයුතු කර තවදුරටත් ලංසු ලබා ගැනීමටත් |

කම්ටු වාර්තාව අනුව ජාත්‍යන්තර වර්ගීකරණ සංගම් සම්මේලනයේ සාමාජික සංගමයකින් ලබාගත් වලංගු මුහුදු ගමන් සඳහා යෝග්‍යතා සහතිකය (Seaworthiness Certificate) හෝ වර්ගීකරණ සංගම් සහතිකය ඉදිරිපත් නොකිරීම, තාක්ෂණික ඇගයීමේදී සැලකිය යුතු ලෙස ප්‍රතිචාර නොදැක්වීම යන කරුණු හේතුවෙන් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම නිර්දේශ කර නොතිබුණි. එසේම, ගොඩබිම බලයලත් නිලධාරී (Designated Person Ashore- DPA) විසින් බෝට්ටු පිළිබඳව සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී මෙම ලංසුකරුවන් දෙදෙනා ලංසු කැඳවීමේ සඳහන් නිර්ණායකයන් සපුරා නොමැති බව තහවුරු වූ අතර 2014/15 වර්ෂයේ සිට මේ දක්වා මෙම බෝට්ටු සැපයුම්කරුවන් දෙදෙනා පමණක් ලංසු ඉදිරිපත් කරන තත්ත්වයක් පවතින බවත් මෙම සැපයුම්කරුවන් සම්බන්ධයෙන් පවතින සේවා විශ්වාසය මත පමණක් පදනම්ව සේවා අවශ්‍යතාවය සලකා ඉල්ලුම්කරුවන් දෙදෙනා ඉදිරිපත් කළ මිල ගණන්වලට 2022 සැප්තැම්බර් 21 දින මෙම ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. 2023/24 වර්ෂයේද මෙම සේවාව සඳහා මෙම සැපයුම්කරුවන් දෙදෙනා වෙතම ප්‍රසම්පාදනය පිරිනමා තිබූ අතර බෝට්ටුවලට අදාළ ලංසු කැඳවීමේ නිර්ණායකයන් සපුරා නොමැති වීම හේතුවෙන් එහි ගමන් කරන නිලධාරීන්ගේ ආරක්ෂාව පිළිබඳව ගැටළුවක් පවතින බවත්, එම අඩුපාඩු හේතුවෙන් යම් අනතුරකදී රක්ෂණ ප්‍රතිලාභ ලබාගැනීමේ අවදානමක් පවතින බවත් නිරීක්ෂණය විය.

ටෙන්ඩර් කැඳවීම සිදුකරන ලදි. එහිදී ඉදිරිපත් වූ ටෙන්ඩර් ඉල්ලුම්කරුවන් අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබූ බවත් තාක්ෂණික ඇගයීම් කමිටුව ප්‍රකාශකර තිබූ අතර, අනුමැතිය ද ලබා දී නොතිබුණි. නමුත් වෙනත් කිසිදු සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් පසුගිය වර්ෂය කිහිපය තුලද ඉදිරිපත් නොවූ අතර මෙවරද එය එසේම සිදුවිය.

ඒ අනුව ඔවුන්ගේ දිගුකාලීන පලපුරුද්ද සහ ඉදිරිපත් කර තිබූ ලිපි ලේඛණ සලකා බලා සංස්ථා කළමණාකාරීත්වයේ ඒකමත්වය තුලින් මෙම ප්‍රසම්පාදනය පිරිනමන ලදි. එසේම මෙය ජාතික අවශ්‍යතාවයක් ලෙස සලකාගෙන වෙනත් විකල්ප ක්‍රමයක් නොමැති බැවින් එම තීරණය අදාල කළමණාකාරිත්වය විසින් ගනු ලැබීය.

මෙහිදී නිලධාරීන්ගේ ආරක්ෂාව සඳහා නිර්දේශිත ජීවිත ආරක්ෂක කබා පැලඳ ගමන් කිරීමට පැලඳ සෑම නිලධාරියෙකුටම අදාල බෝට්ටු හිමියන් විසින් එවා සපයා දෙනු ලබයි. එමගින් ඔවුන්ගේ ගමන් ආරක්ෂාව ලබා දී ඇත.

එම සේවාවේ පවතින අඩුපාඩු අවම කර ගැනීමටත් විධිමත් ක්‍රියාමාර්ග කලමණාකාරීත්වය විසින් ගත යුතු බව.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 16 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 01/2021 හි මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 ඡේදය ප්‍රකාරව උපාය මාර්ගික සැලැසුම් සකස් කළ යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි. 2018/2019 සිට 2022/2023 න් අවසන් පස් අවුරුදු සංයුක්ත සැලැස්ම ව්‍යාපාරික පරිසරයේ වෙනස් වීම්වලට අනුකූලව යාවත්කාලීන කිරීමට අධ්‍යක්ෂක මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | 2018/19 - 2022/2023 පස් අවුරුදු සැලැස්ම 06.12.2018 දින මහා භාණ්ඩාගාරය වෙත යවා ඇති අතර 2023/2024 වර්ෂය සඳහා වාර්ෂික යාවත්කාලීන වාර්තාව 12.08.2019 දින ලබා දීමට කටයුතු යොදා ඇත. කොවිඩ් වසංගත තත්වය හමුවේ නිවසේ සිට සේවය කිරීම සහ වැඩ මුර ක්‍රමයට කාර්යාල කටයුතු සිදුවීම හේතුවෙන් පස් අවුරුදු සැලැස්මට අදාල වාර්ෂික යාවත්කාලීන වාර්තා සකස් කිරීම ප්‍රමාද වුවද 2023/24 – 2027/2028 පස් අවුරුදු සැලැස්ම දැනට සකස් කරමින් පවතින බව දන්වනු කැමැත්තෙමු. | අදාළ චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ සමාගමේ අනිවාර්ය අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකි වන පරිදි උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | 2019/2018 - 2022/2023 සංයුක්ත සැලසුමේ 4.2 ඡේදයෙහි යෝජිත නව ව්‍යාපාරික සැලැසුම් 07ක් දක්වා තිබුණි. ඒවායින් ක්‍රියාකාරකම් 05ක් 2019/2018 සිට 2023/2022 වර්ෂ 05ක් තුළ ළඟාවීමට සැලසුම් කර තිබුණු නමුත් එම ක්‍රියාකාරකම් වෙත ළඟාවී නොතිබුණු අතර නව ව්‍යාපාරික අවස්ථා හඳුනා ගැනීමටද කටයුතු කර නොතිබුණි. | මෙහි සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ කටයුතු සිදු වෙමින් පැවතුණද එක් එක් කරුණු යටතේ පිළිතුරේ දක්වා ඇති තත්වයන් යටතේ ඒවා ක්‍රියාත්මක කිරීම ඇණ හිටිනි. | සංයුක්ත සැලැස්මේ සඳහන් ව්‍යාපාරික සැලසුම් හෝ විධිමත් පරිදි හඳුනාගත් නව ව්‍යාපාරික සැලසුම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු බව. |

### 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් ආදායම් ප්‍රභවයන් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලසුම තුළ අර්ථාන්විත ලෙස ඉලක්ක හා කාර්යසාධන දර්ශක පිහිටුවීම සිදුකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ඉලක්ක පිහිටුවීමේදී පසුගිය වර්ෂයේ සැලසුම් කළ ඉලක්ක හා තත්‍ය තත්ත්වය පිලිබඳව සැලකිලිමත් නොවී සමාගමේ කාර්යසාධන ඉලක්ක පිහිටුවීමේදී පහසුවෙන් ලඟාකර ගත හැකි ඉලක්ක පිහිටුවා ඒ මත කාර්යසාධනය මැන දැක්වීමක් සිදු කර තිබුණි. මීට අමතරව සමාගම විසින් ආදායම් ප්‍රභව හඳුනා ගැනීමේදී වර්ෂය තුළ ජනනය නොවන ආදායම් ප්‍රභවයන්ද ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත කර තිබුණි. විස්තර පහත පරිදි වේ. | සී/ස. ලංකා නැව් සංස්ථාව සතු නෞකා දෙක ගල් අඟුරු සමාගමට ගල් අඟුරු ප්‍රවාහනය සඳහා යොදා නොගත් අතර, ජාත්‍යන්තර වෙළඳාම තුලින් වැඩි වරලත් කුලී ආදායමක් ඉපයීම සඳහා යොදවන ලදි. ලංකා ගල් අඟුරු සමාගමේ ගල් අඟුරු ප්‍රවාහනය කිරීමට තිබූ කාලයද වරලත් කුලී ආදායම ඉපයීමට යොදවා තිබූ නිසා | ආයතනයේ අපේක්ෂිත අරමුණුවලට ළඟා විය හැකි වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම විධිමත් ව සකස් කිරීමට කළමනාකාරීත්වය කටයුතු කළ යුතු බව. |

| ආදායම් ප්‍රභවය | ක්‍රියාකාරී සැලැස්ම අනුව | | සත්‍ය කාර්යසාධනය | | ආදායම් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | ආදායම | වියදම | ආදායම | වියදම | (%) |
| ගල් අඟුරු ප්‍රවාහනය | 3,128 | 2,675 | - | - | |
| වරලත් කුලී ආදායම | 2,293 | 816 | 5,337 | 1,893 | 133% |
| Address Commission on Freight | 72 | - | - | - | |
| Address Commission on Lightering | 472 | - | 314 | - | -33% |
| ගල් අඟුරු සපයන නැව් සඳහා නියෝජිත සේවා සැපයීම | 41 | - | 15 | - | -63% |
| කන්ටේනර් තුළ බහාළුම් ප්‍රවාහනය | 564 | 496 | 760 | 611 | 35% |
| රේගුවෙන් භාණ්ඩ නිෂ්කාශණය හා බෙදා හැරීම | 20 | 12 | 67 | 47 | 235% |

සංස්ථා වරලත් කුලී ආදායම වැඩි වී ඇත. එම සමාගම විසින් සී/ස. ලංකා නැව් සංස්ථාවට දෙනු ලැබූ නැව් ගාස්තු ගැලපීමට (match & win) නොහැකි වීම නිසා මෙම අපේක්ෂිත ආදායම වූ රු.මිලියන 72 ඉපයීමට නොහැකි විය. තවද Address Commission on Lightering ආදායම අඩුවීමට ප්‍රධාන හේතුව වූයේ ගෙන්වන ලද ගල් අඟුරු ප්‍රමාණ ගිවිසුම් ගත වූ ප්‍රමාණයට සාපේක්ෂව අඩු වූ නිසාය. ගල් අඟුරු නැව් තොග 37 ක් පමණ රැගෙන ඒමට අපේක්ෂිත වූ අතර රැගෙන ඒමට හැකි වූයේ ගල් අඟුරු නැව් තොග 23 ක් පමණි.නිත්‍ය නොවන නැව් සේවාව මගින් කරනු ලබන ව්‍යාපාරික අතරට ගැනෙන බහාලුම් ප්‍රවාහනය කිරීම මගින් රු. මි. 564 ක් ලෙස අපේක්ෂිත ආදායම ගණනය කිරීමේදී ඊට බලපාන්නා වූ සියළු කාරණා සැලකිල්ලට ගනිමින් ඉලක්කයක් සකස් කරනු ලබයි. භාණ්ඩ නිෂ්කාශනය, රට තුල ප්‍රවාහනය, ගොඩ බෑම හා අනෙකුත් සියලුම සේවාවන් සඳහා වූ වියදම් ද ඉතා අසාමාන්‍ය අයුරින් ඉහල යාමට ඉහත දක්වන ලද සියළු කරුණු හේතුවිය.